සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර 02 විභාගය - 2026 ජුලි

## (2804) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2026-07-26
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන් වඩාත් හොඳින් නිරූපණය වන්නේ කුමකින් ද?

(1) බඳවා ගැනීම, පුහුණුව, අලෙවිකරණය සහ විකිණීම.

(2) සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම සහ පාලනය.

(3) අයවැයකරණය, ගිණුම්කරණය, විගණනය සහ වාර්තාකරණය.

(4) නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම, ඇසුරුම්කරණය සහ බෙදාහැරීම.

**1.2** නිවැරදි දේ ඉටුකර ගැනීම හඳුන්වන්නේ:

(1) සඵලදායකත්වය. (2) කාර්යක්ෂමතාවය. (3) ඵලදායිතාවය. (4) සංවර්ධනය.

**1.3** සංචාරක හෝටලයක, ඉදිරිපස කාර්යාල අධීක්ෂකවරයා (Front Office Supervisor) විසින් පිළිගැනීමේ නිලධාරීන්ගේ කටයුතු සෘජුවම අධීක්ෂණය කරනු ලබන අතර, දෛනික කාර්යයන් පැවරීම, අමුත්තන්ට නිසි ලෙස සේවය සපයන බවට තහවුරු කිරීම සහ මෙහෙයුම් ගැටළු සම්බන්ධයෙන් අදාල දෙපාර්තමේන්තු කළමනාකරු වෙත වාර්තාකිරීම සිදුකරනු ලබයි.

සංවිධාන ධුරාවලිය තුළ, ඉදිරිපස කාර්යාල අධීක්ෂකවරයා අයත් වන්නේ පහත සඳහන් කළමනාකරුවන්ගෙන් කුමන කාණ්ඩයට ද?

(1) ඉහළ මට්ටමේ කළමනාකරු. (2) මධ්‍යම මට්ටමේ කළමනාකරු.

(3) පහළ මට්ටමේ කළමනාකරු. (4) උපක්‍රමික මට්ටමේ කළමනාකරු.

1.4 කළමනාකරණයේදී, තීරණ ගැනීම වැදගත් ලෙස සලකන්නේ:

(1) එමඟින් ව්‍යාපාර මෙහෙයුම්වල පවතින සියළු අවදානම් ඉවත් කරන නිසාය.

(2) සේවකයින්, විධානයන්, තරයේ පිළිපදින බව එමඟින් තහවුරු කරන නිසාය.

(3) එමඟින් කළමනාකරුවන් හට විකල්පයන් අතුරෙන් හොඳම ක්‍රියාමාර්ගය තෝරාගැනීමට උපකාරී වන නිසාය.

(4) එමඟින් සංවිධානවල සියළුම අලාභයන් ඉවත් කරන නිසාය.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, සංවිධානකරණ (organizing) ක්‍රියාවලියේ පියවරක් ලෙස සැලකිය **නොහැක්කේ** කුමක් ද?

(1) රාජකාරී පැවරීම. (2) අභිප්‍රේරණය.

(3) දෙපාර්තමේන්තුකරණය. (4) කාර්යය හඳුනාගැනීම සහ බෙදීම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.8 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය,* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.6 එකඟ වූ අපේක්ෂාවන් සැලකිල්ලට ගනිමින් කාර්යසාධනය පෙන්නුම් කිරීමට සහ ඒ සඳහා වගකීම බාර ගැනීමට ඇති බැඳීම, බලය යනුවෙන් අදහස් කරයි.

1.7 කළමනාකරණයේ අපේක්ෂාව, පාලනයේදී සලකා බැලිය යුතු සාධකයකි.

1.8 කළමනාකරුවෙකු සැළසුම්කරණය සහ පාලන කටයුතු පිළිබඳ අවධාරණය යොමුකරන විට, නායකයෙකු මිනිසුන් පෙළඹවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.9 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.9 පණිවිඩය යවන්නා විසින් අදහස් කරන ............ *(නිවැරදි / ආසන්නතම)* පුද්ගලයාට පණිවිඩය ලඟා වෙන බව සළලදායී සන්නිවේදනයෙන් අවශ්‍ය කෙරේ.

1.10 ශක්තීන් සහ දුර්වලතා යනු ශදූඅත (SWOT) විශ්ලේෂණයේ ............ *(අභ්‍යන්තර / බාහිර)* සාධක වේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 02)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 ප්‍රති-ප්‍රේරණය වූ / අභිප්‍රේරණය නොවූ (de-motivated) සේවකයෙකුගේ ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

1.12 "සන්නාමකරණය" (Branding) යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

1.13 "අධිකාරීත්වය" සහ "වගකීම" අතර වෙනස සඳහන් කරන්න.

1.14 හොඳ උපායමාර්ගයක ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

1.15 මානව සම්පත් කළමනාකරණයේ අරමුණු දෙකක්(02) සඳහන් කරන්න. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

ප්‍රසිද්ධ ක්ෂණික ආහාර ජාලයක් වන **ABC Foods** විසින් සෞඛ්‍ය සම්පන්න ආහාර සහ වේගවත් බෙදාහැරීම් කෙරෙහි පාරිභෝගික රුචිකත්වයන්ගේ වෙනසක් නිරීක්ෂණය කර තිබේ. කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය පවත්වා ගනිමින් මෙම වෙනස්කම්වලට අනුව, මෙහෙයුම්, අලෙවිකරණය සහ ක්‍රියාවලින් කළමනාකාරීත්වය විසින් අනුවර්තනය කළ යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **ABC Foods** සඳහා වන සාර්ථක වෙනසක පරාමිතීන් (parameters of a successful change) දෙකක්(02) **සඳහන් කරන්න.**
(ලකුණු 02)

(b) **ABC Foods** සඳහා සැලසුම්කරණයේ ඇති වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **ABC Foods** හි වෙනස්කම් සඵලදායී ලෙස කළමනාකරණය කිරීමට උපකාරී වන සංවිධානකරණයේ වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.**
(ලකුණු 04)
(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC ෆිනෑන්ස් සමාගම,** සේවකයන් 120 කින් සමන්විත වර්ධනය වන සමාගමකි. සමාගම, පාරිභෝගික සේවාවන් වැඩි දියුණු කිරීමට සහ ක්‍රියාවලි කාලය අඩුකිරීමට ඩිජිටල්කරණය කරන ලද ණය අනුමත කිරීමේ පද්ධතියක් මෑතකදී හඳුන්වාදෙන ලදී. මෙම උපායමාර්ගයට සහාය වීම සඳහා, කළමනාකාරීත්වය විසින් පාරිභෝගික සම්බන්ධතා, අවදානම් විශ්ලේෂණය සහ ඩිජිටල් මෙහෙයුම් සඳහා වෙනම කණ්ඩායම් නිර්මාණය කරමින් ආයතනික ව්‍යුහය වෙනස් කරන ලදී. කෙසේවුවද, අපැහැදිලි වූ වාර්තා කිරීමේ පිළිවෙල (reporting lines) සහ සමහර සුපරික්ෂකවරුන්ගේ ප්‍රතිරෝධය හේතුකොටගෙන, සේවකයින් සන්නිවේදන ගැටළුවලට මුහුණපාන ලදී. කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා, ප්‍රධාන විධායක නිළධාරියා [Chief Executive Officer (CEO)] විසින් පුහුණුව, කණ්ඩායම් වැඩ සහ සහභාගීත්ව නායකත්වය (participative leadership) තුළින් තම කාර්යමණ්ඩලය අභිප්‍රේරණය කිරීමට කළමනාකරුවන් දිරිමත් කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිද්ධිය භාවිතයෙන්, ආයතනික උපායමාර්ගය සහ ආයතනික ව්‍යුහය අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න.**
(ලකුණු 04)

(b) **සීමාසහිත ABC ෆිනෑන්ස් සමාගමේ** සාර්ථක නායකයෙකු ලෙස, ප්‍රධාන විධායක නිළධාරියාට උපකාරී වන විශිෂ්ඨ නායකත්ව සාධක දෙකක්(02) **පැහැදිලි කරන්න.**
(ලකුණු 04)

(c) ඉහත සිද්ධියට අනුව, **සීමාසහිත ABC ෆිනෑන්ස් සමාගම** විසින් මුහුණ දෙනු ලබන සඵලදායී සන්නිවේදනයට ඇති බාධාවන් දෙකක්(02) **සඳහන් කරන්න.**
(ලකුණු 02)
(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

**Trans Move Logistics,** මෑතකදී එහි මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා ගෝලීය ස්ථාන නිර්ණය කිරීමේ පද්ධතිය මගින් නිරීක්ෂණය කිරීම (GPS tracking), ස්වයංක්‍රීයගත ගබඩා පද්ධති සහ මාර්ගගත බෙදාහැරීමේ කාල සටහන් කිරීම හඳුන්වාදෙන ලදී. සමාගම, ශ්‍රී ලංකාව පුරා භාණ්ඩ ප්‍රවාහනය කරන අතර, බෙදාහැරීමේ ප්‍රමාදයන් සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට බලාපොරොත්තු වේ. මෙහෙයුම් සම්බන්ධ පාලනය පවත්වා ගැනීම සඳහා ඉන්ධන භාවිතය, වාහන නඩත්තුව, සේවක කාර්යසාධනය සහ පාරිභෝගික පැමිණිලි නිරන්තරයෙන් කළමනාකරුවන් විසින් අධීක්ෂණය කරයි. සමාගම විසින් ඇණවුම් ලබාගැනීම, භාණ්ඩ ඇසුරුම් කිරීම, වාහනවලට පැටවීම, ප්‍රවාහනය, පාරිභෝගිකයින් වෙත අවසන් බෙදාහැරීම වශයෙන් නිෂ්පාදන පියවර කිහිපයක් අනුගමනය කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **Trans Move Logistics** හි මෙහෙයුම් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(b) **Trans Move Logistics** හි මෙහෙයුම් මත නව තාක්ෂණයේ බලපෑම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **Trans Move Logistics** හි මෙහෙයුම් කළමනාකරණය සඳහා භාවිත කළ හැකි නව තාක්ෂණයන් දෙකක්(02) **සඳහන් කරන්න.**

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**Fresh Bite Foods** යනු වර්ධනය වෙමින් පවතින ආහාර සමාගමකි. ආයතනික කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා, මානව සම්පත් දෙපාර්තමේන්තුව [Human Resources Department (HRD)] විසින් කුසලතා සහිත සේවකයින් බඳවා ගැනීම, පුහුණු වැඩ සටහන් පැවැත්වීම සහ නිරන්තර සේවක කාර්යසාධනය ඇගයීම සිදුකරනු ලබයි. මෑතකදී, **Fresh Bite Foods** මගින් කාර්යක්ෂමතාවය සහ සේවක කළමනාකරණය ඉහළ නැංවීම සඳහා මාර්ගගත බඳවා ගැනීම, සේවක ස්වයංසේවා ද්වාර (employee self-service portals) සහ කෘත්‍රිම බුද්ධිය මත පදනම් වූ පැමිණීම (AI-based attendance) නිරීක්ෂණය කිරීම වැනි ඩිජිටල්කරණය වූ මානව සම්පත් පද්ධතියක් හඳුන්වාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **Fresh Bite Foods** සඳහා මානව සම්පත් කළමනාකරණයේ ඇති වැදගත්කම් තුනක්(03) **පැහැදිලි කරන්න.**

(ලකුණු 06)

(b) **Fresh Bite Foods** සඳහා යොදාගත හැකි පුහුණු ක්‍රම දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) **Fresh Bite Foods** හි මානව සම්පත් කළමනාකරණය සඳහා සලකා බැලිය හැකි නවෝත්පාදනයන් (innovations) **දෙකක්(02) සඳහන් කරන්න.**

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

කෘෂි ව්‍යාපාරික සමාගමක් වන **සීමාසහිත Green Harvest Agro සමාගම,** ශ්‍රී ලංකාව පුරා ඇති සුපිරි වෙළෙඳසැල් සහ හෝටල් සඳහා එළවළු සහ පළතුරු සපයන අතර, සමාගම විසින් තම නිෂ්පාදිත, රටවල් කිහිපයකට අපනයනය කිරීමට සැලසුම් කරමින් සිටී. නැවුම් නිෂ්පාදිත නිසි වේලාවට අවම නාස්තියක් යටතේ බෙදාහැරීම තහවුරු කිරීම සඳහා සමාගම විසින් සඵලදායි සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ අවධානය යොමුකොට ඇත. අලෙවිකරණ දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගිකයින් ආකර්ශනය කර ගැනීමට සහ විකුණුම් ඉහළ නංවා ගැනීම සඳහා මිලකරණය, ප්‍රවර්ධනය, ඇසුරුම්කරණය සහ බෙදාහැරීමේ උපායමාර්ග භාවිත කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සැපයුම්දාම කළමනාකරණය කිරීම සඳහා **සීමාසහිත Green Harvest Agro සමාගමට** භාවිත කළ හැකි උපායමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න.**

(ලකුණු 02)

(b) **සීමාසහිත Green Harvest Agro සමාගමට** සඵලදායි සැපයුම්දාම කළමනාකරණයේ ඇති වැදගත්කම් **දෙකක්(02) පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(c) පාරිභෝගිකයින් ආකර්ශනය කර ගැනීමට සහ විකුණුම් ඉහළ නැංවීමට **සීමාසහිත Green Harvest Agro සමාගමට** භාවිත කළ හැකි මිලකරණ ක්‍රම දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

**සීමාසහිත Desert Wave Logistics සමාගම** යනු නැව්ගත කිරීම් සහ සැපයුම් සේවා සපයන මධ්‍යම ප්‍රමාණයේ සමාගමක් වන අතර, මැද පෙරදිග රටවල් කිහිපයක් පුරාවට මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යනු ලබයි. පවතින කලාපීය ගැටුම් සහ ආර්ථික අස්ථාවරත්වය සමාගමට බහුවිධ අභියෝග හටගෙන ඇති අතර, ඒවා අතරට බාධාවලට ලක්වූ වෙළෙඳ මාර්ග, උච්ඡාවචනය වන ඉන්ධන මිල, හදිසි නියාමන වෙනස්වීම් සහ දේශසීමා මුරපොළවල සිදුවන අනපේක්ෂිත ප්‍රමාදයන් ඇතුළත් වේ. මෙම අභියෝග හේතුවෙන් සමාගමට නිසි වේලාවට බෙදාහැරීම් පවත්වාගෙන යාමට, මෙහෙයුම් පිරිවැය කළමනාකරණය කර ගැනීමට සහ පාරිභෝගික තෘප්තිය සහතික කිරීමට සැලකිය යුතු ආකාරයේ පීඩනයක් එල්ල කර ඇත.

මෙම ගැටළු විසඳීම සඳහා, **සීමාසහිත Desert Wave Logistics සමාගම** විසින් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට ඉක්මන් මෙහෙයුම් තීරණ ගැනීමට සහ තත්‍ය කාලීන උපාය මාර්ග අනුගමනය කිරීමට සියළු මට්ටම්වල කළමනාකරුවන් මත විශ්වාසය තබයි. ඉහළ කළමනාකාරීත්වයේ නියෝග ක්‍රියාකාරී සැළසුම් බවට පරිවර්තනය කිරීමේදී මධ්‍යම කළමනාකරුවන් තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරන අතර, පළමුපෙළ කළමනාකරුවෝ එදිනෙදා මෙහෙයුම් අධීක්ෂණය කරන අතර, තම කණ්ඩායම් යාවත්කාලීන කරන ලද ක්‍රියාපටිපාටි (protocols) අනුගමනය කරන බව සහතික කරති. මේ අතර, අලෙවිකරණ කණ්ඩායම, සමාගමේ සේවාවන්හි විශ්වාසනීයත්වය සහ ආරක්ෂාව පිළිබඳව අවධාරණය යොමු කිරීමට, නම්‍යශීලී මිලකරණ උපාය මාර්ග හඳුන්වා දෙමින්, විශ්වසනීයත්වය සහ පක්ෂපාතීත්වය පවත්වා ගැනීමට සඳහා ගනුදෙනුකරුවන්ට සිදුවන වෙනස්කම් වහාම සන්නිවේදනය කරමින් තම ප්‍රචාරණ ව්‍යාපාර හැඩගස්වා ඇත. තවද, අවශ්‍යතාවයන් අවබෝධ කර ගනිමින්, ඉහළ කළමනාකාරීත්වය විසින් පුහුණුව සහ සංවර්ධනය සඳහා දිරිමත් කරනු ලැබේ.

ඉහළ කළමනාකාරීත්වය විසින් භූ දේශපාලන තත්ත්වය, ඉන්ධන මිල ප්‍රවණතා සහ නියාමන යාවත්කාලීන කිරීම් අඛණ්ඩව නිරීක්ෂණය කරන අතර, ඒ අනුව සමාගමේ දිගුකාලීන උපායමාර්ග සකස් කරනු ලබයි. අභියෝගාත්මක තත්ත්වයන් යටතේ වුවද සමාගමේ තරඟකාරීත්වය පවත්වාගෙන යාමට ඔරොත්තු දෙන සහ සේවාදායකයින්ගේ අපේක්ෂාවන් සපුරාලීමට හැකියාව ඇති බව තහවුරු කිරීම සඳහා නායකත්වය මගින් උපායමාර්ගික චින්තනය, නම්‍යශීලීත්වය සහ පූර්ව ක්‍රියාකාරීව ගැටළු විසඳීම අවධාරණය කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) රොබර්ට් එල්. කැට්ස් (Robert L. Katz) විසින් පැහැදිලි කරන ලද විවිධ මට්ටම්වල කළමනාකරුවන්ට අවශ්‍ය ප්‍රධාන කුසලතා (key skills) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) අර්බුධ කාලය තුළදී, **සීමාසහිත Desert Wave Logistics සමාගම** විසින් භාවිතකරන ලද අලෙවිකරණ මිශ්‍රයේ මූලිකාංග දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **සීමාසහිත Desert Wave Logistics සමාගමට** ඩිජිටල් අලෙවිකරණයේ ඇති වාසි හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) **සීමාසහිත Desert Wave Logistics සමාගමෙහි** වෙනස්වීම පිළිගැනීමට සේවකයින් දිරිමත් කරන ක්‍රම තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(e) **සීමාසහිත Desert Wave Logistics සමාගමෙහි** උපාය මාර්ගයට බලපෑම් කළ හැකි බාහිර සාධක දෙකක්(02) **හඳුනා දක්වා** එම එක් එක් සාධකය, **සීමාසහිත Desert Wave Logistics සමාගමේ** උපායමාර්ගික තීරණවලට බලපාන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(f) සඵලදායී පුහුණු කිරීමක් හරහා **සීමාසහිත Desert Wave Logistics සමාගමට** ලැබෙන ප්‍රතිලාභ හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

| කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව | | | |
|---|---|---|---|
| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
| මතක තබා ගැනීම<br>කරුණු,පද, මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ | හඳුනා දක්වන්න | කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම. | මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න. |
| | නිර්වචනය කරන්න | වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම. | පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම. |
| | හඳුනා ගන්න | පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය. | පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම. |
| | සඳහන් කරන්න | පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම. | ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකාශ කිරීම. |
| | ලැයිස්තුගත කරන්න | නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්. | ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම. |
| | සටහන් කරන්න | පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම. | අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම. |
| අවබෝධය<br>තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම. | ගොඩ නගන්න | මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම. | විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම. |
| | වෙනස් කොට දක්වන්න | දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම. | සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම. |
| | විමසන්න | මාතෘකාවක් පිළිබදව විවිධ අදහස් සහ මත සලකා බැලීම. | විවිධ දෘෂ්ඨිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම. |
| | පැහැදිලි කරන්න | යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම. | තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම. |
| | ගෙනහැර දක්වන්න | කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය. | සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම. |
| | අර්ථකථනය කරන්න | තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම. | යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම. |
| | විස්තර කරන්න | යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්. | අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම. |
| | සාරාංශගත කරන්න | ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්. | සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම. |
| භාවිතය<br>අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ. | භාවිත කරන්න. | යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම. | ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම. |
| | ගණනය කරන්න. | ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම. | විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම. |
| | තීරණය කරන්න | පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම. | ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම. |
| | ප්‍රදර්ශනය කරන්න. | ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම. | ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම. |
| | පිළියෙල කරන්න. | භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම. | කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම. |
| | භාවිත කරන්න | සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම. | අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම. |
| | ඉදිරිපත් කරන්න. | සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම. | මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම. |
| විශ්ලේෂණය<br>ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම | විශ්ලේෂණය කරන්න | සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම. | වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම. |
| | සසඳන්න | සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම. | ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම. | යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම. |
| | පරීක්ෂා කරන්න | යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම. | යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. | ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම. |
| | ක්‍රියා කරන්න | අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම. | කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම. |
| | වාර්තා කරන්න | සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම. | විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම. |
| අගය කරන්න<br>නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබදව විනිශ්චයන් සිදු කිරීම. | උපදෙස් දෙන්න | යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම | විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම. |
| | අගය කරන්න | වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම. | නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම. |
| | සකස් කරන්න | ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම. | හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම. |
| | නිර්දේශ කරන්න | සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම. | තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම. |
| නිර්මාණය කිරීම<br>සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව | නිර්මාණය කරන්න | අළුත් දෙයක් නිර්මාණය කිරීම. | අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම. |
| | තක්සේරු කරන්න | ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම. | පවතින තොරතුරු මත පදනම්ව තර්කානුකූල විනිශ්චයන් ලබා දීම. |
| | සංවර්ධනය කරන්න | අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම. | කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම. |
| | යෝජනා කරන්න | සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම. | අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම. |
| | සංයෝජනය කරන්න | විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම. | විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම. |
| | සැලසුම් කරන්න | යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම. | නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම. |
| | ගොනු කරන්න | විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම. | එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම. |